# ශ්‍රී ලංකාවේ ආදි වාසි දෘශ්‍ය කලාව තුළ නිරූපිත සත්ව රූපයන්ගේ කලාත්මක පරිචය හඳුනාගැනීම

කේ. උදේනි අරුණසිරි
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
udenisjp@yahoo.com

ආදි වාසීන් විසින් ප්‍රගුණ කරමින් පැමිණි දෘශ්‍ය කලාවක් පිළිබඳව මෙරටින් සාධක ලැබී ඇත. එම දෘශ්‍ය කලාව ශෛල චිත්‍ර, ප්‍රාථමික චිත්‍ර, ප්‍රකෘතික කලා, ප්‍රාග් ඓතිහාසික කලා, කුරුටු චිත්‍ර හා වැදි චිත්‍ර යන නාමයන්ගෙන් ද හැඳින්වේ. මෙරටින් හමුවී ඇති ආදි වාසි ගුහා සිතුවම් පිළිබඳව විද්වතුන් රාශියක් පර්යේෂණය කර ඇත. එම පර්යේෂණයන් තුළදී ඒවා ප්‍රාථමික ගනයේලා හඳුන්වා ඇත. එම පර්යේෂණයන්හිදී සත්ව රූපයන්ගේ නිර්මාණාත්මක ලක්ෂණ පිළිබඳව ප්‍රමුඛ අධ්‍යයනයක් සිදුවී නොමැති බව පෙනේ. මෙම පර්යේෂණයේ ගැටළුව වන්නේ මෙරට ආදි වාසි සිතුවම් අතර වන සත්ව රූපයන්ගේ ප්‍රාථමික ස්වරූපය ඉක්මවා ගිය විශේෂතාවන් හඳුනාගත හැකි ද යන්නයි. මෙහි අරමුණ මෙරට ආදි වාසි සිතුවම් අතර වන සත්ව රූපයන්ගේ නිර්මාණාත්මක ලක්ෂණ අධ්‍යයනය කිරීම වේ. ඒ අනුව පුස්තකාල අධ්‍යයනය මගින් මෙරට ප්‍රාථමික සිතුවම් පිළිබඳව සිදුකරන ලද පර්යේෂණ ග්‍රන්ථ, වාර්තා හා ඡායාරූප අධ්‍යයනය කරනු ලැබීය. තවද මූලාශ්‍ර මගින් හඳුනාගන්නා ලද දිස්ත්‍රික්ක 5ක විසිරී ඇති ස්ථාන 10ක පිහිටි තෝරාගත් සත්ව රූප 10ක් ක්ෂේත්‍රගතව සන්සන්දනාත්මක අධ්‍යයනය කරන ලදි. මූලාශ්‍ර අධ්‍යයනයෙන් හා ක්ෂේත්‍රගතව ලබාගන්නා ලද තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් අවසන් නිගමනයන්ට පිවිසෙන ලදි. මෙරට ආදි වාසි සිතුවම් හි කාල නීර්ණය පිළිබඳව විධිමත් විද්‍යාත්මක පර්යේෂණයක් සිදුවී නොමැතිවීම නිසා එම කලාව පිළිබඳව ඇත්තේ මතභේදයකි. මෙම ආදි මානව සිතුවම් අතර සත්ව රූ රාශියක් හඳුනාගත හැකි වේ. පර්යේෂණයේදී ගවයා (බිල්ලව හා වෙහෙරගලකන්ද), මුගටියා (කඳුරුපොකුණ හා හුලන්නුගේ), කිඹුලා (හුලන්නුගේ), ඇතා(දොරවක්කන්ද හා පන්සල් කන්ද) කොටියා (කිරිපොකුණහෙල), බල්ලා (පුළුකුණාව) හා සිංහයා (බුදුගල) යනාදී වශයෙන් සත්ව රූ 10ක් අධ්‍යයනය කරන ලදි. සත්ව රුව යනු දෘශ්‍ය කලාවේ ඇති චිරස්ථායි තේමාවකි. සත්ව රුවක් ඇඳීමේදී මනස මුලින්ම ග්‍රහනය කරගනු ලබන්නේ එම සත්වයාගේ මූලික හැඩය හා අන්‍ය සතෙකුගෙන් වෙන් කර හඳුනාගත හැකි කැපී පෙනෙන ලක්ෂණ කිහිපයකි. මෙහි ඉදිරි විකාශනය විවිධ ඉරියව් නිරූපණය යි. එයට යම් පරිචයක් අවශ්‍ය වේ. සත්ව රූ ඇඳීමේදී අඳුර සහ ආලෝකය මගින් ශරීරය මත ඇති කරන හැඩතලයන් මතුකිරීම, ව්‍යූහ විද්‍යාත්මකව ඇඳීම හා ජ්‍යාමිතික හැඩතලයන්ගෙන් මතුකිරීම යන ප්‍රවේශයන් භාවිතා කරනු ලබයි. මෙම සිතුවම්හිදී උක්ත දෙවන හා තෙවන ප්‍රවේශයන් භාවිතා කර ඇත. මනා අධ්‍යයනයකින් යුතුව සෞන්දර්යාත්මක දෘශ්ටියකින් නිර්මාණය කරන ලද සත්ව රූප ද මෙහි වේ. ඒ අනුව ආදි මානව සිතුවම් අතර ඇති ඇතැම් සත්ව රූප එම දෘශ්‍ය කලා කරුවන්ගේ කලා පරිචය හා මනා නිරීක්ෂණයන්ගේ එකතුවක් ලෙස පෙන්වා දිය හැකි වේ.

**ප්‍රමුඛ පද** - ආදි වාසි; සිතුවම්; සත්ව; කලාව; පර්යේෂණ